**සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම - 2016/2017**

**-----------------------------------------------------------**

2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3. විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මෙම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලන විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1. මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින්, 2017 මාර්තු 31 දිනට සීමා සහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා වාර්තාව

----------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තය ප්‍රකාරකව මා විසින් පහත ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මගේ මතය තුල:

- විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණවලින් පිළිඹිබු වන පරිදි, සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා තබා තිබුණි.
- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1. ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 36 - වත්කම් හායනය (Impairment of Assets)

------------------------------------------------------------------------------

වත්කම් හායනය පිළිබඳ පරික්සාවක් සිදුකිරීම හෝ ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක්ද ගෙන නොතිබුණි. මේ නිසා මත්තල ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා මිලදී ගෙන තිබූ පිරිවැය රු. 59,534,711 ක් වූ උපකරන සම්බන්ධයෙන් වාර්ෂිකව සිදු කරන සියයට 20 ක් හෙවත් රු. 11,241,785 ක් වූ හානිකරණ වෙන් කිරීමෙහි සම්පූර්ණත්වය හා නිවැරදිතාවය පිළිබඳ සහතික විය නොහැක.

#### 2.2.2. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

-----------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ මුළු වත්කම් වූ රු. මිලියන 10,571 අතරින් රු. මිලියන 6,707 ක් එනම් සියයට 63 ක් මෙම සමාගම වූ ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් (මව් සමාගමෙන්)

අයවිය යුතුව පැවතුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශවල සටහන් මගින් මේ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

## 2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| i. 7.4.5 පරිච්ඡේදය | 2016/17 වර්ෂය සඳහා සමාගමේ වත්කම් සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි. |
| ii. 9.2 (ඞී) පරිච්ඡේදය | සමාගමේ සංවිධාන සටහන හා අනුමත කාර්ය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |
| iii. 9.3.1 (1) වගන්තිය | සමාගමේ බඳවා ගැනීමේ හා උසස් වීමේ පරිපාටිය (SOR) මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,736,386,777 ක් ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ ශුද්ධ ලාභය රු. 3,637,855,159 ක් වුයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 98,531,618 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ගුවන් යානා සඳහා ආහාර සැපයීමේ මුළුතැන් ගෙවල්වලින් ආදායම රු. 555,640,220 ක වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2. විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා සහ පූර්ව වර්ෂ 04 ක් සඳහා සමාගමේ වැදගත් අනුපාත පහත දී ඇත.

| | 2016/17 | 2015/16 | 2014/15 | 2013/14 | 2012/13 |
|---|---|---|---|---|---|
| ජංගම වගකීම් වලට ජංගම වත්කම් (වාර ගණන) | 8.76 | 9.74 | .50 | 8.72 | 6.19 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක්ෂණික අනුපාතය | 8.46 | 9.43 | 9.03 | 8.26 | 5.62 |
| ණය හිමිකම් අනුපාතය | 0.19 | 0.21 | 0.44 | 0.55 | 0.63 |
| EPS - කොටසක ඉපැයුම | 3.97 | 3.87 | 2.33 | 2.41 | 1.51 |
| කොටසක ලාභාංශය | 3.38 | 3.29 | 2.23 | 1.36 | 2.39 |
| දළ ලාභ අනුපාතය | 77% | 77% | 76% | 75% | 77% |
| ප්‍රාග්ධනයට හිමිකම් අනුපාතය | 46% | 49% | 37% | 49% | 38% |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් වලට ජංගම වත්කම් අනුපාතය (ජංගම අනුපාතය) සහ ක්ෂණික අනුපාතය පහළ ගොස් තිබූ අතර ගෙවිය යුතු වෙළඳ ශේෂ වැඩි වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) බදු පසු ලාභයේ වැඩි වීම නිසා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ කොටසක ඉපැයුම් පිළිවෙලින් ශත 10 සහ රු. 1.54 විය. කෙසේ වුවද කොටසක ඉපයුමෙහි වර්ධනය සංසන්දනාතාමකව සියයට 96 ක් පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1. කාර්යසාධනය

---------------

සංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය වන්නේ ගුවන් ගමන් සඳහා ආහාර සැපයීමට භාවිතා කරන කරන මුළුතැන්ගෙවල් මෙහෙයවීම සහ නඩත්තු කිරීමය, ආහාර පාන හා ගුවන් මගීන්ට අවශ්‍ය වෙනත් දේ සැපයීම ආදිය සහ කුඩා ආපන ශාලා (Cafes and restaurants) හිමිකරුවන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමත් වේ.
එක් එක් මූල්‍ය උත්පාදන අංශවල විකිණුම් ආදායම් සහ ලාභ/ අලාභ පහත පරිදි විය.

| **ආදායම් ප්‍රභවය** | **මුළු ආදායම රු. මිලියන** | **වර්ෂය සඳහා ලාභ/ අලාභ රු. මිලියන** |
|---|---|---|
| ගුවන් යානා සඳහා ආහාර සපයන මුළුතැන්ගේ (Flight Kitchen) ආදායම | 5,526.50 | 3,053.39 |
| බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ආපනශාලාව | 1,104.49 | 479.31 |
| වැනිලා පොඩ් | 22.23 | 5.35 |
| සෙමන්දු ආපනශාලාව | 78.36 | 4.09 |
| ට්‍රාන්සිට් හෝටලය | 113.69 | 36.25 |
| එමිරේට්ස් ලොජ් | 143.39 | 72.62 |
| මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොල ආපනශාලාව | 28.84 | (10.14) |
| ඇඳුම් පිරිසිදු කිරීම | 198.63 | 95.51 |
| **එකතුව** | 7,216.13 | 3,736.39 |

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ආපනශාලාව සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 10.14 ක පාඩුවක් ලබා තිබූ අතර එය එහි වාර්ෂික ආදායමෙන් සියයට 35 ක් නියෝජනය කෙරුණි.

**4.2** මානව සම්පත් කළමනාකරණය

---------------------------------

2017 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ සේවක සංඛ්‍යාව 1046 ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 1022 ක් විය. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් විය. කෙසේ වුවද, සමාගමේ කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ, මධ්‍යම හා පහළ මට්ටම් යන සේවා වර්ගීකරණය අනුව හඳුනාගෙන නොතිබූ අතර සමස්ත කාර්ය මණ්ඩලය පමණක් අනුමත කර තිබුණි.

5. තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

-------------------------------------------

ශ්‍රී ලංකන් කේටරින් සමාගම විසින් 2030 වර්ෂයේදී අරමුණු ළඟා කර ගැනීම පිළිබඳ න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත්ව නොසිටීම නිසා තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට ක්‍රියා කර නොතිබූ අතර ඒවාට අදාල ක්‍රියාකාරකම්, ඉලක්ක ළඟා කර ගැනීමේ සංධිස්ථාන සහ ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ ඇගයීම සඳහා නිර්ණායකයන් හඳුනාගෙන නොතිබුණි.

**5.** පද්ධති හා පාලන

------------------

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | සමාගම සතු වත්කම් අංක කිරීමේ ක්‍රමවත් ක්‍රමවේදයන් නොමැති වීම.<br>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් සත්‍යාක්ෂණය කිරීමට අසමත් වීම. |
| (ඇ) තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණය | පවත්නා සියලු පද්ධති වලට ප්‍රවේශ වීම සඳහා කාර්යභාරය සහ වගකීම් පැවරීම සඳහා අනුමත හා ලිඛිතව සිදු කර නොතිබුණු අතර භාවිතා කරන්නන්ගේ ප්‍රවේශ විමේ අයිතිය පිළිබඳව කාලානුරූපව විධිමත් සමාලෝචනයක් සිදු කර නොතිබුණි. තවද, සක්‍රිය මුරපදය සහ ගිණුම් අගුලු දැමීමේ පද (Lock out Configuration) ඇතුළත් සංග්‍රහය සකස් කර නොතිබුණි. |
| (ඈ) ගිණුම්කරණ පද්ධති | ගිණුම්කරණ පද්ධතිය මගින් ප්‍රතිඵල සටහන් සහ ගෙවීම් වවුචර් සඳහා අනුක්‍රමික අංක පිළිවෙලින් නිකුත් කරන බවට සහතික කර නොතිබුණි. |